චක්‍රලේඛ අංක :: 03/2021

මගේ අංකය: ආර්ජී/එන්බී/01/චක්‍රලේඛ
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල
2021.02. 25

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>ලියාපදිංචිය සඳහා භාර දෙනු ලබන ලේඛනවලට මුද්දර ගාස්තු ගෙවූ බව සනාථ කර ගැනීම.</u>

1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ 22 වගන්තියට හා නොතාරිස් ආඥා පනතේ 31 (6) , (7) වගන්තිවලට අනුව නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කරනු ලබන ලේඛන සඳහා නියමිත පරිදි මුද්දර ගාස්තු ගෙවිය යුතු වේ. මුද්දර ගාස්තුවට යටත් ලේඛනයක් සඳහා යථා පරිදි මුද්දර ගාස්තු ගෙවා නොමැති නම් එවැනි ලේඛනයක් ලියාපදිංචි කිරීම ඉඩම් රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් ප්‍රතික්ෂේප කළ යුතු බව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 36 (2) වගන්තියෙහි දක්වා ඇත.

2. ලේඛන සඳහා මුද්දර ගාස්තු ගෙවීම සම්බන්ධව නෛතික විධිවිධාන සලසා තිබුණ ද යම් යම් නොතාරිස්වරුන්, තමා විසින් ලියා සහතික කරනු ලබන ලේඛන සඳහා නිසි පරිදි දෙවන පිටපතට මුද්දර ගාස්තු නොගෙවන බවට මා වෙත වාර්තා වී ඇත. මෙය රජයට ලැබිය යුතු ආදායම් අහිමි කිරීමක් මෙන්ම මහජනතාව වෙත එම ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීමේදී ද අප දෙපාර්තමේන්තුවට ගැටළුවක් වී ඇත.

3. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ලේඛනවලට අදාළ මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවා තිබේද යන්න සනාථ කර ගත යුතු වේ. ලියාපදිංචි කිරීමට ඔබ වෙත භාර දෙනු ලබන ලේඛන මඟින්ද ඒ බව තහවුරු කර ගැනීමේ හැකියාව පවතී. මේ සඳහා දෙවන පිටපතට

මුද්දර ගාස්තු ගෙවන ලද රිසිට්පතේ පිටපතක් මුල් පිටපත සමඟ භාර ගැනීම සුදුසු යැයි නිරීක්ෂණය කරමි. ඒ අනුව විකුණුම්කර සහ තෑගිකර ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කිරීමේදී එහි දෙවන පිටපතට මුද්දර ගාස්තු ගෙවන ලද රිසිට්පතේ පිටපතක් හෝ අදාළ නොතාරිස්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද එම රිසිට්පතේ ඡායා පිටපතක් මුල් පිටපතට අමුණා භාර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද එසේ කටයුතු කරනු නොලබන ලේඛන සම්බන්ධව ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (117 අධිකාරිය) 36 (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

04. මෙම විධිවිධාන 2021.03.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු අතර මේ සම්බන්ධව නොතාරිස්වරුන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. සියළුම කළාපභාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කා.දැ.ස. හා අ.ක.ස
2. සියළුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කා.දැ.ස. හා අ.ක.ස
3. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කා.දැ.ස.
4. ලේකම් / සභාපති - ශ්‍රී ලංකා නීතිඥ සංගමය -කා.දැ.ස.සහ සාමාජිකත්වය දැනුවත් කිරීම සඳහා